**දැන්වීමයි**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු අධිකාරි තනතුර සඳහා බඳවා ගැනීමේ ( සීමිත ) තරග විභාගය 2022

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු අධිකාරි තනතුරෙහි පවතින පුරප්පාඩු 08 ක ප්‍රමාණයක් සඳහා සීමිත පදනම මත මෙම දෙපාර්තමේන්තුවේ පහත සඳහන් සුදුසුකම් ඇති ප්‍රධාන සුරාබදු පරීක්ෂක/ සුරාබදු පරීක්ෂක තනතුරෙහි සේවය කරන නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත සම්පූර්ණ කර පහත සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "සුරාබදු අධිකාරි තනතුරට බඳවා ගැනීම - සීමිත 2022" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තව ද විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

(අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2024.12.10 දින වේ.

**සටහන :-** ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැක. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

## 2. සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය

ලිඛිත විභාගය හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වන අතර, ලිඛිත විභාගයෙන් විෂයන් දෙකම සමත් අයදුම්කරුවන් අතුරින් ඉහළම ලකුණු ලබා ගත් පිළිවෙළ අනුව බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් පස්ගුණයක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත විභාගයේ හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු පුරවනු ලැබේ.

## 3. සුදුසුකම්

### 3.1. පළපුරුද්ද හා අනෙකුත් සුදුසුකම්

I. තනතුරේ ස්ථිර කර ඇති ප්‍රධාන සුරාබදු පරීක්ෂකවරයකු වීම හෝ වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් ඇති, තනතුරේ ස්ථිර කර ඇති සුරාබදු පරීක්ෂකවරයකු වීම.

II. තනතුරුවලට අදාළව සියලුම කාර්යක්ෂමතා කඩඉම් සමත් වී තිබීම.

III. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම.

IV. පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම. (පූර්වාසන්න සතුටුදායක සේවා කාලය තීරණය කිරීමේ කාර්යය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධාන හා ඊට සිදු කරනු ලැබූ සංශෝධනයන් අදාළ කරගනු ලැබේ.)

V. උසස්වීම් දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

**3.2. කායික සුදුසුකම්**

I. සෑම අපේක්ෂකයකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

**3.3 වෙනත්**

I. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

II. තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය ඉහත සුදුසුකම් **<u>2021.06.11 දිනට</u>** සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**4. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි**

I. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

II. මෙම පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ය. තනතුරට බඳවාගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

III. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර තුනක් (03) තුළදී ලබා ගත යුතුය. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතුය.

IV. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, දෙපාර්තමේන්තු නියෝග, රජය මගින් නිකුත් කර ඇති හා නිකුත් කරනු ලබන නියෝගවලට යටත් වේ.

V. ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

VI. රාජ්‍ය සේවා කොමිෂන් සභා විසින් පත්වීම් ලිපි නිකුත් කරනු ලබන දිනය හෝ ඉදිරි දිනයක සිට බලාත්මක වන පරිදි පත්වීම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

සටහන :- සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ එදිනට සේවයේ යෙදී සිටින නිලධාරීන් පමණි.

5. **වයස් සීමාව**

අදාළ නොවේ.

6. **වැටුප් පරිමාණය**

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය රු. 47,615 – 10 x 1,335 – 8 x 1,630 – 17 x 2,170 – 110,895 (SL-1-2016) වේ.

07. **යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

| අනු අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | <u>කාර්ය සාධන ඇගයීම (පූර්වාසන්න වසර 05 හි)</u> | | |
| | I. විශිෂ්ට | 04 | 20 |
| | II. සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ | 02 | |
| 02 | <u>සාධු සටහන් / ප්‍රශංසා (අදාළ තනතුරේදී ලබාගත්)</u> | | |
| | I. විශේෂ සාධු සටහන් එකකට | 04 | 30 |
| | II. සාමාන්‍ය සාධු සටහන් එකකට | 03 | |
| | III. ප්‍රශංසා | 01 | |
| 03 | <u>අධ්‍යාපන සුදුසුකම්</u><br>1) නීතිය,<br>2) කළමනාකරණය,ව්‍යාපාර කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය හා මානව සම්පත් කළමනාකරණය,<br>3) ආර්ථික විද්‍යාව හා බදුකරණය,<br>4) මූල්‍ය කටයුතු හා ගිණුම්කරණය,<br>5) ගණිතය හා සංඛ්‍යානය,<br>6) පරිගණක විද්‍යාව හා තොරතුරු තාක්ෂණය,<br>7) සමාජ විද්‍යාව හා අපරාධ විද්‍යාව,<br>8) මනෝවිද්‍යාව හා උපදේශනය,<br>9) මත්පැන්, මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණය,<br>10) සැපයුම් කළමනාකරණය ( Logestic Management ), | | |

| | | | |
|---|---|---|---|
| | 11) රසායන විද්‍යාව, භෞතික විද්‍යාව,<br>12) ජීව විද්‍යාව හා ආහාර විද්‍යාව,<br>13) භාෂාව,<br>14) අවධානම් කළමනාකරණය<br><br>යන ක්ෂේත්‍රයන්ට අදාලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිලිගත් උපාධි පිරිනැමීමේ ආයතනයකින් ලබාගත් පහත සඳහන් සුදුසුකම් සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.<br>I. පශ්චාත් උපාධිය<br>II. පශ්චාත් උපාධි ඩිප්ලෝමා<br>III. උපාධිය<br>IV. ඩිප්ලෝමා (SLQF 03 හෝ 04 මට්ටමේ)<br>**සටහන :-**<br>උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. දැනටමත් සුරාබදු දෙපාර්තමේන්තුවට බඳවාගැනීමේදී හෝ කාර්යක්ෂමතා කඩඉමක් ලෙස හෝ උසස් කිරීමක් සඳහා වූ සුදුසුකමක් ලෙස සලකා බලා ඇති සුදුසුකමකට ලකුණු හිමි නොවේ. | 20<br>15<br>10<br>05 | **20** |
| 04 | <u>සේවයට අදාළ පුහුණු</u><br>පහත ක්ෂේත්‍රයන්ට අදාළ පුහුණුවීම් සඳහා ලකුණු ලබාදීමට කටයුතු කරනු ලැබේ.<br>1) නීතිය,<br>2) කළමනාකරණය,ව්‍යාපාර කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය හා මානව සම්පත් කළමනාකරණය,<br>3) ආර්ථික විද්‍යාව හා බදුකරණය,<br>4) මූල්‍ය කටයුතු හා ගිණුම්කරණය,<br>5) ගණිතය හා සංඛ්‍යානය,<br>6) පරිගණක විද්‍යාව හා තොරතුරු තාක්ෂණය,<br>7) සමාජ විද්‍යාව හා අපරාධ විද්‍යාව,<br>8) මනෝවිද්‍යාව හා උපදේශනය,<br>9) මත්පැන්, මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණය,<br>10) සැපයුම් කළමනාකරණය ( Logestic Management ),<br>11) රසායන විද්‍යාව, භෞතික විද්‍යාව,<br>12) ජීව විද්‍යාව හා ආහාර විද්‍යාව,<br>13) භාෂාව,<br>14) අවධානම් කළමනාකරණය | | |

| | | | |
|---|---|---|---|
| | යන ක්ෂේත්‍රයන්හි දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන පුහුණුවීම්,<br><br>I. වසරකට වඩා වැඩි<br>II. මාස 6කට වඩා වැඩි හා වසරක් දක්වා<br>III. මාස 3කට වඩා වැඩි හා මාස 6ක් දක්වා<br>IV. මාසයකට වඩා වැඩි හා මාස 3ක් දක්වා<br>V. සතියකට වඩා වැඩි හා මාසයක් දක්වා<br>VI. සතියකට වඩා අඩු<br><br>සටහන :-<br>ඉහත පුහුණුවීම්වල කාලසීමා තීරණය කිරීමේදී එක් වර්ෂයක පූර්ණකාලීන පුහුණුවකින් පුහුණු පැය 1500 ක් ආවරණය වන බව සලකනු ලැබේ.<br><br>සටහන :-<br>උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. දැනටමත් සුරාබදු දෙපාර්තමේන්තුවට බඳවාගැනීමේදී හෝ කාර්යක්ෂමතා කඩඉමක් ලෙස හෝ උසස් කිරීමක් සඳහා වූ සුදුසුකමක් ලෙස සලකා බලා ඇති සුදුසුකමකට ලකුණු හිමි නොවේ. | <br><br>15<br>07<br>05<br>02 | 15 |
| 05 | <u>විශිෂ්ට ක්‍රියා සඳහා</u><br>සාධු සටහනකට හෝ ප්‍රශංසාවකට පාදක වූ දෙපාර්තමේන්තුවේ කාර්යන්ට අදාළ නව්‍යකරණයකට හෝ දෙපාර්තමේන්තුවට කීර්තියක් ලබා දුන් ක්‍රියාවකට ලකුණු 05 බැගින් හිමිය. | | 10 |
| 06 | <u>සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම</u><br>I. නායකත්වය<br>II. සන්නිවේදන කුසලතා<br>III. පෞරුෂත්වය | 02<br>02<br>01 | 05 |
| | මුළු එකතුව | | 100 |

8. ලිඛිත විභාගය:-

**8.1** මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යන් හා අදාළ විෂය පිළිබඳ වූ දැනුම | පැය 02 | 100 | 40% |
| සාමාන්‍ය දැනුම | පැය 01 | 100 | 40% |
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |

**8.2** විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යන් හා අදාළ විෂය පිළිබඳ වූ දැනුම | i. සුරාබදු ආඥා පනත, වසවිස, අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥා පනත ඇතුළත් සුරාබදු අත්පොත iii වැනි කොටස (නීතිය) සංශෝධන සහිතව<br>ii. දෙපාර්තමේන්තු නියෝග ඇතුළත් සුරාබදු අත්පොත i වැනි කොටස<br>iii. සුරාබදු නිවේදන ඇතුළත් සුරාබදු අත්පොත iv කොටස හා ඉන්පසු නිකුත් කර ඇති සියලුම සුරාබදු නිවේදන<br>iv. අපරාධ නඩු විධාන සංග්‍රහය, ලංකා දණ්ඩ නීති සංග්‍රහය හා සාක්ෂි ආඥා පනත සම්බන්ධව දෙපාර්තමේන්තු නියෝග 378 හි ඇතුළත් පරිදි එකී විෂය නිර්දේශය<br><br>අපරාධ නඩු විධාන සංග්‍රහය - (කොටස 3, 23-26, 27-31,33-37,52-53, 70, 74-78, 133, 148-149, 167-168, 169, 170-179, 187-199, 312(2) සහ (3), 406-407, 413(i) සහ 443)<br><br>ලංකා දණ්ඩ නීති සංග්‍රහය - (කොටස 19, 24-25, 75-76, 89-100, 101-109, 112, 138-146, 158-160, 183-186, 198-200, 214,219- 221,265-266, 340-342 සහ 344) |

| | |
|---|---|
| | සාක්ෂි ආඥා පනත (කොටස 1-32, 53-54, 91-92,101-106,133,137-138 සහ 159-161)<br>v. කාර්මික සංග්‍රහය (සුරාබදු අත්පොත ii කොටස) (ඉහත i සිට v දක්වා ඉහළ මට්ටමක දැනුමක් අපේක්ෂා කෙරේ) |
| සාමාන්‍ය දැනුම | ශ්‍රී ලංකාවේ හා ලෝකයේ කාලීන සමාජීය සිදුවීම් තොරතුරු පිළිබඳව හා සාමාන්‍ය දැනුම මැන බැලීම |
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය සහ තීරණ ගැනීමේ හැකියාව වැනි කරුණු නිශ්චය කරනු ලැබීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි |

**9. විභාග කොන්දේසි**

I. විභාගය සිංහල දෙමළ භාෂා මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර සියල්ලටම පෙනී සිටිය යුතුය.

II. විභාග ගාස්තුව රු.1200/- කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක්/ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

III. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ. විභාග ගාස්තු වශයෙන් මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

IV.මෙම විභාගය.................................මස කොළඹදී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම්දෙනු ලැබේ.

සටහන :- ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

V. ඉල්ලුම් පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළයුතු අතර, 01-05 තෙක් ශීර්ෂ පළමුවන පිටුවෙහි අඩංගු වන ලෙස ගෙන සකස් කළ යුතු අතර අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. මේ සමග ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ඉල්ලුම් පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත ගැසට් නිවේදනයට යා කර ඇති ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් දන්වමි.

VI. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත් පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්මේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය.

VII. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග,ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කර ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළග තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

VIIi. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

IX. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

X. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

XI. එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

සැලකිය යුතුය :- ( අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් නොඇමිණිය යුතුය.

( ආ) ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවකදී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

XI. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්/ සහකාර සුරාබදු කොමසාරිස් මඟින් සහතික කර යොමු කළ යුතු වේ.

10. සාවද්‍ය තොරතුරු සැපයීම

I. ඔබ විසින් එවන ලද අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

II. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

- ❖ මෙහි පළමු ඡේදයේ සඳහන් පුරප්පාඩු සියල්ල හෝ ඉන් කොටසක් හෝ නොපුරවා තැබීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

- ❖ මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කරුණක් සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබනු ඇත.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩී.එච්.එස්. පුල්ලපෙරුම
අතිරේක ලේකම්
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන,
සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය

(signature) ......................................

ලේකම්
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය (වෙනුවට)

2024 ....නොවැම්බර්.... මස ....08.... දින

<u>ආදර්ශ අයදුම්පත</u>

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා )

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු අධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2022**

**Limited Competitive Examination for the Recrument of the Post of Excise Superintendent Sri lanka Excise Department – 2022**

(අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියන්න. සිංහල - 2 / දෙමළ - 3) [ ]

**සටහන :-** අයදුම් කරන මාධ්‍ය වෙනස් කළ නොහැක.

---

<u>I කොටස ( අයදුම්කරු විසින් සම්පූර්ණ කිරීම සඳහා )</u>

1.0 1.1 සම්පූර්ණ නම (මයා/ මිය/ මෙය) :- ..........................................................................
(සිංහලෙන්/ දෙමළෙන්) ..........................................................................

1.2 සම්පූර්ණ නම :- ..........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 මුලකුරු සමඟ නම (මයා/ මිය/ මෙය) :-..........................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

උදා:- එම්.ජී.බී.එස්.කේ. ගුණවර්ධන

1.4 මුලකුරු සමඟ නම :- ..........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් )

2.0 2.1 ස්ථිර ලිපිනය :- ..........................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 ස්ථිර ලිපිනය :- ..........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය:- පුරුෂ 0 ස්ත්‍රී 1 [ ] (අංකය කොටුව තුළ ලියන්න)

3.2 විවාහක/ අවිවාහක බව:- විවාහක - 1 අවිවාහක - 2 [ ] (අංකය කොටුව තුළ ලියන්න)

3.3 උපන් දිනය:- වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

4.0 ජාතික හැඳුනුම්පත් අංකය:- [ | | | | | | | | | | | ]

5.0 දුරකථන අංකය:- ස්ථාවර | | | | | | | | | | |

ජංගම | | | | | | | | | | |

6.0 6.1 දැනට දරන තනතුර :- ..........................................................................................

6.2 එයට පත් වූ දිනය :- ..........................................................................................

6.3 එම තනතුරේ ස්ථිර කරන ලද දිනය :- ..........................................................................

6.4 සුරාබදු පරීක්ෂක තනතුරට පත් වූ දිනය :- ....................................................................

6.5 සුරාබදු පරීක්ෂක තනතුරේ ස්ථිර කරන ලද දිනය :- ..........................................................

6.6 ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරට පත් වූ දිනය :- ..........................................................

6.7 ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරේ ස්ථිර කරන ලද දිනය :- ................................................

6.8 ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
සමත් වූ දිනය :-..........................................................................................

6.9 පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක උපයාගෙන තිබේද යන්න :- ......................................

7.0 වර්තමාන සේවා ස්ථානය :- ..........................................................................................

8.0 සපුරා ඇති අධ්‍යාපන සුදුසුකම් :- ..................................................................................

9.0 සපුරා ඇති විශිෂ්ට ක්‍රියා :-..........................................................................................

10.0 ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද යන්න හෝ විනයානුකූල කටයුතුවලට භාජනය වී තිබේ ද යන්න ? (ඔව් නම් විස්තර කරන්න)

11.0 විභාග ගාස්තු

11.1 ගෙවූ මුදල :- ..................................................

11.2 ගෙවූ කාර්යාලය :- ..........................................

11.3 ගෙවූ දිනය :- ..................................................

11.4 ලදුපත් අංකය :- ..............................................

11.5

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න

(ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වේ )

12.0 අයදුම්කරුගේ සහතිකය

මෙම අයදුම්පතේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම ප්‍රකාශ කරමි..

.........................................  .....................................

දිනය  අයදුම්කරුගේ අත්සන

II කොටස (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**01.** අයදුම්පතේ 01 සිට 10 දක්වා කරුණු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි වේ.

විෂය ලිපිකරුගේ නම : .......................................................................
අත්සන : .....................................
දිනය:- 2024.

**02. පරිපාලන නිලධාරි/ අංශ ප්‍රධානිගේ සහතිකය**

❖ අයදුම්පතේ 01 සිට 10 දක්වා කරුණු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සනාථ කරමි.

නම: ..................................................................
තනතුර: ......................................................................
අත්සන : ........................................
දිනය:- 2024.

**03. නියොජ්‍ය සුරාබදු කොමසාරිස්ගේ/ සහකාර සුරාබදු කොමසාරිස්ගේ නිර්දේශය**

ඉහත විස්තර සඳහන් ........................................................................................ මහතා/මහත්මිය / මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, ඔහු/ඇය ...................... දින මා ඉදිරිපිටදී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

............................................................
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්/ සහකාර සුරාබදු කොමසාරිස්
දිනය :- ........................................
(නිල මුද්‍රාව යොදන්න)